*සැ. යු.-* 2023.11.24 දින පළකරන ලද අංක 2360 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,361 - 2023 දෙසැම්බර් මස 01 වැනි සිකුරාදා - 2023.12.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.-* (i) මලෙයහ ශිෂ්‍ය උසස් අධ්‍යාපන අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 නොවැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) වන්නි මන් පුණ්‍යායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2023 නොවැම්බර් මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍ර* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 දෙසැම්බර් මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 දෙසැම්බර් මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


601 - B 082519 — 353 (2023/12)
D 1 -

# පිස්කල් විකිණීම

## කළුතර දිසා අධිකරණයේ දී ය

මහජන බැංකුව,
අංක 75, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

*කළුතර දිසා අධිකරණ නඩු අංකය* : MB 1048
*කළුතර දිසා අධිකරණ ඇස්කීසි අංකය* : 43/2023

.........................*පැමිණිලිකරු.*

1. කත්‍රි ආරච්චිගේ දොන් රාහුල සිරිවර්ධන,
   අංක 2බී, සෙත්සිරි උයන අසල,
   මතුගම පාර, ගල්ලස්ස හන්දිය,
   නාගොඩ, දොඩන්ගොඩ,
   කළුතර.

2. පල්ලෙක් කංකානම්ගේ රසිකා සුදර්ශනී,
   අංක 2බී, සෙත්සිරි උයන අසල,
   මතුගම පාර, ගල්ලස්ස හන්දිය,
   නාගොඩ, දොඩන්ගොඩ,
   කළුතර.

.........................*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ මා වෙත නිකුත් වී ඇති ඇස්කීසිය අනුව, 01 වැනි විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවීමට ඇති රුපියල් විසිතුන් ලක්ෂ හැට පන් දහස (රු. 2,365,000/-) ක මුදල වර්ෂ 2012ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා වසරකට 18% බැගින් වූ පොළිය ද ඇතුලුව නඩු ගාස්තු ද, 01 වැනි විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට වර්ෂ 2019.03.01 වැනි දින කළුතර දිසා අධිකරණය විසින් දෙන ලද නඩු තීන්දුව ප්‍රකාර ව එය ඉටු කිරීමට එකී 01 වැනි විත්තිකරු අපොහොසත් වූ බැවින් මා විසින් වර්ෂ 2023.08.02 වැනි දින තහනම් කරන ලද 01 වැනි විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සඳහන් දේපළ කළුතර, දොඩන්ගොඩ, නාගොඩ, ගල්ලස්ස හන්දිය, මතුගම පාර, සෙත්සිරි උයන අසල, අංක 2බී යන ලිපිනයේ දී වර්ෂ 2023ක් වූ දෙසැම්බර් මස 21 වැනි දින ප.ව. 2.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

### උපලේඛනය

කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩීජී. 231/272 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇති බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ, නාගොඩ ග්‍රාමයේ පිහිටි ''වෙනිවැල්කැටිය'' නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් 1977.11.20 දින මැන සකස් කරන ලද අංක 1735 දරන පිඹුරේ කැබලි අංක 8 දරන ඉඩමට මායිම් :

| | |
|---|---|
| උතුරට | : ප්‍රධාන පාර, |
| නැගෙනහිරට | : ලොට් අංක 9, |
| දකුණට | : ලොට් අංක 28, |
| බස්නාහිරට | : ලොට් අංක 07, |

යන මායිම් තුළ පිහිටි පර්චස් විසි එකයි දශම දෙකයි බින්දුව (පර්. 21.20) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සියළුම දේ ද සමඟ වේ.

රෙජිස්ට්‍රාර්/පිස්කල්,
දිසා අධිකරණය,
කළුතර.

වර්ෂ 2023 ක් වූ ඔක්තෝබර් මස 19 වැනි දින දී ය.

12-48

# විවිධ දැන්වීම්

## සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය

නුවරඑළිය, හාවාඑළිය, උඩුපුස්සැල්ලාව පාර, අංක 84 හි පිහිටි ඉන්ටර්ෆැෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිබඳ කාරණයේ දී ය.

*නඩු අංකය* : CHC/69/2023/CO
*ස්වභාවය* : ඈවර කිරීම

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ 270(ඉ) සහ (ඊ) වගන්තිය යටතේ, ඉන්ටර්ෆැෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් නම් වූ සමාගම අධිකරණය විසින් ඈවර කරනු ලැබීම පිළිබඳ කාරණයේ දී ය.

ගාමෙක්ස් ඉන්ටර්නැෂනල් හෝල්ඩිංග්ස් ලිමිටඩ්,
ෆ්ලැට්/ආර්එම් 1702 17/F, සිනෝ සෙන්ටර්, 582-592, නේතන් රෝඩ්, මොංග්කොක් කේඑල් හොංකොං.

.........................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක්, වර්ෂ 2023.09.14 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ කේ. උපේන්ද්‍ර ගුණසේකර විසින් ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම වර්ෂ 2023.12.14 වැනි දින අධිකරණය ඉදිරියෙ හි විමසීමට නියම කර ඇති බවද, එකී පෙත්සම මත නියෝග යක් කිරීම තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියෙකු හෝ සහදායකයෙකු වේ නම් ඒ තැනැත්තාට තත්කාර්ය සඳහා එය විමසීමට ලක් කරන අවස්ථාවෙ හි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද, මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. උපේන්ද්‍ර ගුණසේකර,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 135-1/3, ගුණසිංහපුර කාර්යාල සංකීර්ණය,
ශාන්ත සෙබස්තියන් වීදිය,
කොළඹ 12.

*සටහන.-* එකී පෙත්සම විමසීමට ලක් කරන අවස්ථාවෙ හි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තෙකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ කේ. උපේන්ද්‍ර ගුණසේකර වෙත භාර දිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතු ය. එම දැන්වීමෙ හි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද, ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙකු වෙතොත්) එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන් ම 2023.12.13 වැනි දින සවස 06ට පෙර ලැබෙන ලෙස භාර දිය යුතු ය. *නැතහොත්* තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වෙලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව තැපැල් කළ යුතු ය.

12-65

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2023 වර්ෂය** | | | |
| **දෙසැම්බර්** | 2023.12.01 | සිකුරාදා | 2023.11.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.08 | සිකුරාදා | 2023.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.15 | සිකුරාදා | 2023.12.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.22 | සිකුරාදා | 2023.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2023.12.29 | සිකුරාදා | 2023.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2024 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2024.01.05 | සිකුරාදා | 2023.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.12 | සිකුරාදා | 2023.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.19 | සිකුරාදා | 2024.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.26 | සිකුරාදා | 2024.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2024.02.02 | සිකුරාදා | 2024.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.09 | සිකුරාදා | 2024.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.16 | සිකුරාදා | 2024.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.22 | බ්‍රහස්පතින්දා | 2024.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.